තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## කේ.එම්.ජී. කොඩිකාර එ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගලේවෙල

RTIC Appeal (ලේඛනගත කාර්යය පටිපාටිය)/ 471/2018 (2020.06.10) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - කේ.එම්.ජී. කොඩිකාර
**නොතිසි ලත් පාර්ශවය**- නම් කළ නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගලේවෙල

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.01.16 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.03.13 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.05.11 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2018.01.16 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

කැන්දගමුව ග්‍රාම නිලධාරී වසමේ ජනතා විරෝධී යනුවෙන් හඳුන්වාගත් සංවිධානයක් විසින් එම වසමේ 2017 ජනවාරි 24 සිට 2017 මැයි 04 දක්වා සේවය කළ ග්‍රාම නිලධාරී එම් කේ ජී උපාලි මහතාට විරුද්ධව විරෝධතා ලිපියක් ගරු අග්‍රාමාත්‍ය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

තුමාට යොමු කිරීමෙන් පසු ඒ සම්බන්ධ වාර්තාවක් ලබා ගැනීම සඳහා ගරු අග්‍රාමාත්‍ය තුමා විසින් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ එම ලිපියේ පිටපතක් හා ඊට පිළිතුරු ලෙස ගලේවල ප්‍රාදේශීය ලේකම් ගරු අග්‍රාමාත්‍ය තුමාට යොමු කළ වාර්තාවේ සහතික කළ පිටපත්

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.03.13 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.05.11 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා, මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. **ඒ අනුව මෙම අභියාචනය සඳහා, ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරනු ලැබේ.** ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමකට ලක් විය හැකියි.

පොදු අධිකාරිය විසින් 2018.11.23 දිනැති ලිපිය මගින් අභියාචක සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිලිවලට විනයානුකූල ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භ කොට ඇති බවත් ඉල්ලා ඇති තොරතුරු ද එම විනයානුකූල ක්‍රියාමාර්ගවලට අදාළ වන බැවින් එම කටයුතු අවසන් වන තෙක් එම තොරතුරු ලබා දිය නොහැකි බව පවසා ඇත.

**නියෝගය:**

අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් වන හෙයින්, පොදු අධිකාරියේ තීරණය අනුමත කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.